සැ. යු.-මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2015 වර්ෂය සඳහා පොළොන්නරුව මහාධිකරණ කලාපයට අයත් ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් පමණක් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,939 - 2015 ඔක්තෝබර් මස 30 වැනි සිකුරාදා - 2015.10.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1836 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1849 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 නොවැම්බර් මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 නොවැම්බර් මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය.''*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු
### පුත්තලම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්‍ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 නොවැම්බර් මස 30 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 ඔක්තෝබර් මස 08 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| පුත්තලම | ආරච්චිකට්ටුව | උතුරු පිටිගල් කෝරළේ කොට්ඨාසයේ පුලිච්චාකුලම ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |

10-1036

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### අධ්‍යාපන අමාත්‍යාංශය

#### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 3 පන්තියට බඳවා ගැනීම

1.0 අංක : අමප/02/1904/128/086 හා 2003.01.22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 3 පන්තියේ විශේෂ අධ්‍යාපනය, බටහිර සංගීතය, චිත්‍ර, සංගීතය, ශාරීරික අධ්‍යාපන, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය, තාක්‍ෂණ විෂයයන් සහ ක්‍රිස්තු ධර්මය යන විෂයයන් සඳහා 2012.12.01 දින තෙක් පැවති පුරප්පාඩු පිරවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් අයදුම්පත් භාරගනු ලැබේ.

2.0 මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, 2015.11.30 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ''ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමා අයදුම් කරන විෂයය සහ ''ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ පුරප්පාඩු'' යනුවෙන් සඳහන් කළ යුතුය. සියලුම අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.0 සුදුසුකම් :

ශ්‍රී ලංකා ගුරු සේවයේ හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හෝ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථිර තනතුරක් දරන 2012.12.31 දිනට වසර 03ක සතුටුදායක සේවා පළපුරුද්දක් සහිත නිලධාරීන් මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන අතර එක් එක් විෂයය සඳහා සපුරාලිය යුතු සුදුසුකම් උපලේඛන 1 හි දක්වා ඇත.

4.0 බඳවා ගැනීමේ ක්‍රමය :

4.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් හා ලකුණු දීමේ පරිපාටියකට අනුව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්‍ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. (අදළ ලකුණු දීමේ පරිපාටිය උපලේඛන 2හි ඇත.)

4.2 සම්මුඛ පරීක්‍ෂණයේ දී පහත සඳහන් ලිපිලේඛනවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුතුය. :-

4.2.1 උප්පැන්න සහතිකය හා අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික
4.2.3 වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික
4.2.4 ලකුණු දීමේ පටිපාටියට අනුව ලකුණු ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු සියළුම සහතික

4.3 එක් විෂයය ක්ෂේත්‍රයක් යටතේ ආයතන 03කට ඉල්ලුම් කළ හැකි අතර එක් විෂයය ක්ෂේත්‍රයකට වඩා ඉල්ලුම් කරන්නේ නම් ඒ සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය. ලබාගන්නා වූ ලකුණු අනුපිළිවෙල පදනම් කරගෙන විද්‍යාපීඨ පුරප්පාඩු සම්පූර්ණ කළ පසු පිළිවෙලින් ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථානවල පුරප්පාඩු සම්පූර්ණ කරනු ලබයි.

5.0 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

5.1 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති මෙම පත්වීමට අදළ වේ.

5.2 මෙම පත්වීම තාවකාලිකය. 1999.03.11 දිනැති ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් මූලික සුදුසුකම්වලට වඩා අඩු සුදුසුකම් යටතේ සිදුකරනු ලබන මෙම බඳවා ගැනීමෙන් බඳවා ගන්නා නිලධාරීන් බඳවා ගත් දින සිට වසර 05ක සහන කාලයක් ඇතුළත එම සේවා ව්‍යවස්ථාවේ සඳහන් මූලික සුදුසුකම් සපුරාගත යුතුය. එතෙක් ඔවුන්ට තාවකාලික පත්වීම් ලිපියක් නිකුත් කරනු ලැබේ.

5.2.1 සහන කාලය තුළ උපාධි හෝ ඩිප්ලෝමාධාරීන් අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ විශිෂ්ඨ හෝ සම්මාන සාමාර්ථයක් සහිත පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සහතිකයක් හෝ පළමු/දෙවන පන්තියේ සාමාර්ථයක් සහිත අධ්‍යාපනය පිළිබඳ උපාධියක් ලබා ගත යුතුය.

5.2.2 පුහුණු ගුරු සහතිකයක් ලබා ඇති නිලධාරීන් සහන කාලය තුළ දී අදළ විෂයය පිළිබඳ උපාධියක් හා විශිෂ්ඨ හෝ සම්මාන සාමාර්ථයක් සහිත පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සහතිකයක් ලබා ගත යුතුය.

5.2.3 නියමිත සුදුසුකම් සම්පූර්ණ කර ගැනීමට අපොහොසත්වන නිලධාරීන් තමා කලින් දරූ තනතුරට ආපසු යවනු ලැබේ.

6.0 වයස් සීමාව : අදළ නොවේ.

7.0 සාමාන්‍ය සුදුසුකම් :

7.1 විශිෂ්ඨ චරිතයකින් හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

7.2 මෙම නිවේදනය පරිදි තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් 2012.12.31 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

8.0 වැටුප් පරිමාණය :

මෙම පත්වීම තාවකාලිකය. ඒ අනුව ඔබ මූලික සුදුසුකම් සපුරාගන්නා තෙකේ ඔබට රු. 22,935 ක මාසික වැටුපක් ගෙවනු ලැබේ. දනට ඊට වඩා අඩු වැටුපක් ලබන නිලධාරීන්හට දනට ලබන වැටුප සහ වැටුප් වර්ධක වෙනුවට රු. 250 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

සැලකිය යුතුයි :

- කිසිදු සහතිකයක් හෝ ඡායා පිටපතක් ඉල්ලුම් පත්‍රය සමග එවිය යුතු නොවේ.
- සම්මුඛ පරීක්ෂණයේ දී අවශ්‍ය ලිපි ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයගේ ඉල්ලුම්පත්‍ර ගැන සළකා බලනු නොලැබෙන අතර සම්මුඛ පරීක්ෂණයෙන් පසුව ඉදිරිපත් කරන කිසිදු ලේඛනයක් භාර ගනු නොලැබේ.
- නිවේදනයේ සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සපුරාලන්නේ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් සහතික මත නම් එම විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පිළිගත් ආයතනයක් බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබාගත් තහවුරු කිරීමේ සහතිකයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.
- මෙම පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩබ්. එම්. බන්දුසේන,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2015 ඔක්තෝබර් මස 14 වැනි දින.

*උපලේඛනය 01*

| අනු. අංකය | විෂයය | අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් | මාධ්‍යය | පුරප්පාඩු සංඛ්‍යාව සහ පවතින ස්ථාන |
|---|---|---|---|---|
| 01 | විශේෂ අධ්‍යාපනය | (i) අදළ විෂයයෙන් පුහුණු ගුරු සහතිකය සමග වසර 7කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම. | සිංහල<br>දෙමළ | පුරප්පාඩු 1<br>හාපිටිගම ජා. අ. වි.<br>(බ්‍රේල්)<br>පුරප්පාඩු 2<br>අඩ්ඩාලච්චේන ජා. අ. වි.,<br>යාපනය ජා. අ. වි. |
| 02 | තාක්ෂණික විෂයයන්<br>(i) යාන්ත්‍රික තාක්ෂණය<br>(ii) කලා ශිල්ප | (i) අදළ විෂයයෙන් පුහුණු ගුරු සහතිකය සමග වසර 7කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම. | සිංහල<br>දෙමළ | පුරප්පාඩු 1<br>[1]සියනෑ ජා. අ. වි.<br>පුරප්පාඩු 1<br>[3]සියනෑ ජා. අ. වි.<br>පුරප්පාඩු 1<br>[1]මඩකලපුව ජා. අ. වි. |

| අනු. අංකය | විෂයය | අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් | මාධ්‍යය | පුරප්පාඩු සංඛ්‍යාව සහ |
|---|---|---|---|---|
| | (iii) විදුලි හා ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය<br>(iv) ආහාර - තාක්ෂණය | | | පුරප්පාඩු 1<br>[2]මඩකලපුව ජා. අ. වි.<br>පුරප්පාඩු 1<br>[3]මඩකලපුව ජා. අ. වි.<br>පුරප්පාඩු 1<br>[4]දර්ගානගර් ජා. අ. වි.<br>1. යාන්ත්‍රික තාක්ෂණය<br>2. කලා ශිල්ප<br>3. විදුලි හා ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය<br>4. ආහාර තාක්ෂණය |
| 03 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | (i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක් ලබා තිබීම; හෝ<br>(ii) පිළිගත් විශ්ව විද්‍යාලයකින් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්‍ෂණය විෂයය සහිත උපාධියක් ලබා තිබීම; හෝ<br>(iii) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් පවත්වන ලද අදළ විෂයය පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් හෝ විශිෂ්ඨ/සම්මාන සාමාර්ථයක් සහිත ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකයක් තිබීම. | ඉංග්‍රීසි | පුරප්පාඩු 6<br>රුවන්පුර ජා. අ. වි.,<br>සාරිපුත්ත ජා. අ. වි.,<br>මහවැලි ජා. අ. වි.,<br>වවුනියා ජා. අ. වි. |
| 04 | බටහිර සංගීතය | (i) අදාළ විෂයයෙන් පුහුණු ගුරු සහතිකය; හෝ<br>(ii) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් පවත්වන ලද විභාගයකින් ඩිප්ලෝමාවක් සහ වසර 7කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්ද<br>(අදාළ විෂයය යනු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ක්‍රියාත්මක වන පාඨමාලාවලට අයත් විෂයයන් වේ.) | ඉංග්‍රීසි | පුරප්පාඩු 1<br>මහවැලි ජා. අ. වි. |
| 05 | චිත්‍ර | (i) අදාළ විෂයයෙන් පුහුණු ගුරු සහතිකය සහ වසර 7කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම. | සිංහල<br><br><br><br><br><br><br><br><br><br><br><br>දෙමළ | පුරප්පාඩු 12<br>වයඹ ජා. අ. වි.,<br>පස්දුන්රට ජා. අ. වි.<br>මහවැලි ජා. අ. වි.<br>නිල්වලා ජා. අ. වි.<br>හාපිටිගම ජා. අ. වි.,<br>දඹදෙණිය ජා. අ. වි,,<br>නිට්ටඹුව ජා. අ. වි.,<br>ශ්‍රී පාද ජා. අ. වි.<br>පුලතිසිපුර ජා. අ. වි.<br>ඌව ජා. අ. වි.,<br>රුවන්පුර ජා. අ. වි.<br><br>පුරප්පාඩු 4<br>මඩකලපුව ජා. අ. වි.,<br>අඩ්ඩාලච්චේන ජා. අ. වි.,<br>යාපනය ජා. අ. වි.,<br>ශ්‍රීපාද ජා. අ. වි. |

| අනු. අංකය | විෂයය | අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් | මාධ්‍යය | පුරප්පාඩු සංඛ්‍යාව සහ |
|---|---|---|---|---|
| 06 | සංගීතය | (i) අදාළ විෂයයෙන් පුහුණු ගුරු සහතිකය සහ වසර 7 කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම. | දෙමළ | පුරප්පාඩු 6<br>ශ්‍රීපාද ජා. අ. වි.,<br>මඩකලපුව ජා. අ. වි.,<br>අඩ්ඩාලච්චේන ජා. අ. වි.,<br>දර්ගානගර් ජා. අ. වි. |
| 07 | ශාරීරික අධ්‍යාපනය | (i) අදාළ විෂයයෙන් පුහුණු ගුරු සහතිකය සහ වසර 7කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම | සිංහල | පුරප්පාඩු 9<br>ඌව ජා. අ. වි.,<br>පේරාදෙණිය ජා. අ. වි.,<br>දඹදෙණිය ජා. අ. වි.,<br>පස්දුන්රට ජා. අ. වි.,<br>මහවැලි ජා. අ. වි.,<br>නිල්වලා ජා. අ. වි.,<br>සියනෑ ජා. අ. වි.,<br>වයඹ ජා. අ. වි.,<br>හාපිටිගම ජා. අ. වි. |
| | | | දෙමළ | පුරප්පාඩු 7<br>යාපනය ජා. අ. වි.,<br>ශ්‍රී පාද ජා. අ. වි.,<br>මඩකලපුව ජා. අ. වි.,<br>වවුනියා ජා. අ. වි.,<br>අඩ්ඩාලච්චේන ජා. අ. වි. |
| 08 | ක්‍රිස්තු ධර්මය | (i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයයේ අධ්‍යාපනය පිළිබඳ පළමු හෝ දෙවැනි පන්තියේ උපාධියක් ලබා තිබීම; හෝ<br><br>(ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ පළමු හෝ දෙවැනි පන්තියේ උපාධියක් ලබා තිබීම; හෝ<br><br>(iii) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක් හා අදළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම; හෝ<br><br>(iv) පිළිගත් විශ්විද්‍යාලයකින් අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක් හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සහතිකයක් සහිත වසර 07කට නොඅඩු ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම. | සිංහල | පුරප්පාඩු 1<br>වයඹ ජා. අ. වි. |

**උපලේඛනය 02**

***ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 3 පන්තියට බඳවා ගැනීමේ ව්‍යුහගත හා ප්‍රායෝගික පරීක්ෂණ ලකුණු පරිපාටිය***

(තොරතුරු සන්නිවේදන තාක්ෂණ විෂයය හැර අනෙකුත් විෂයන් සඳහා)

1 කොටස - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - උපරිම ලකුණු 50

01. අධ්‍යාපන සුදුසුකම් : උපරිම ලකුණු 20
(උපලේඛනය 1හි සඳහන් සුදුසුකම් වලට අමතරව ලබා ඇති සුදුසුකම් සඳහා)

(උසස්ම සහතිකය සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)

| | | |
|---|---|---|
| 1.1 | ආචාර්ය උපාධිය (අධ්‍යාපන හෝ අදාළ විෂයය පිළිබඳ) | - 20 |
| 1.2 | පශ්චාත් උපාධිය (අධ්‍යාපන හෝ අදාළ විෂයය පිළිබඳ) | - 15 |
| 1.3 | පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - 10 |

02. ඉංග්‍රීසි භාෂා නිපුණතාවය — උපරිම ලකුණු 10

(උපලේඛනය 1හි සඳහන් සුදුසුකම්වලට අමතරව ලබා ඇති සුදුසුකම් සඳහා)
(උසස්ම සහතිකය සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)

| | | |
|---|---|---|
| 2.1 | උපාධියට ඉංග්‍රීසි විෂයක් ලෙස හදරා තිබීම | - 10 |
| 2.2 | උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදරා තිබීම | - 08 |
| 2.3 | අ. පො. ස. (උ. පෙළ) ඉංග්‍රීසි විෂයක් ලෙස සමත්වීම | - 06 |
| 2.4 | අ. පො. ස. (උ. පෙළ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදරා තිබීම | - 05 |
| 2.5 | විශ්වවිද්‍යාලයක හෝ පිළිගත් ආයතනයක ඩිප්ලෝමා පාඨමාලාවක් හදරා තිබීම (වසරක් හෝ ඊට වැඩි) | - 04 |
| 2.6 | පිළිගත් විශ්ව විද්‍යාලයක සහතික පත්‍ර පාඨමාලාව | - 02 |

03. තොරතුරු තාක්‍ෂණ දැනුම — උපරිම ලකුණු 10

(උපලේඛනය 1 හි සඳහන් සුදුසුකම් වලට අමතරව ලබා ඇති සුදුසුකම් සඳහා)
(උසස්ම සහතිකය සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.)

| | | |
|---|---|---|
| 3.1 | උපාධිය සඳහා තොරතුරු තාක්‍ෂණ විෂයක් ලෙස හදරා තිබීම/ තොරතුරු තාක්‍ෂණ පිළිබඳ පශ්චාත් උපාධිය | - 10 |
| 3.2 | තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (අවුරුදු 01ක් හෝ ඊට වැඩි) | - 06 |
| 3.3 | තොරතුරු තාක්‍ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (මාස 06ට වැඩි) | - 04 |

04. ශාස්ත්‍රීය කාර්යසාධනය (අධ්‍යාපන ක්ෂේත්‍රයට අදළව) — උපරිම ලකුණු 05

| | | |
|---|---|---|
| 4.1 | පර්යේෂණ හා නිබන්ධන (උපාධිය/පශ්චාත් උපාධිය/පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ ආචාර්ය උපාධිය සඳහා ඉදිරිපත් කල පර්යේෂණ හා නිබන්ධන මේ යටතේ අදළ නොවේ) | - 03 |
| 4.2 | ප්‍රකාශන (ප්‍රසිද්ධ සඟරා හෝ පුවත්පත්වල පළවූ) | - 02 |

05. සම්මුඛ පරීක්‍ෂණ කුසලතාවය — උපරිම ලකුණු 05

මුළු ලකුණු — 50

II කොටස - ප්‍රායෝගික පරීක්‍ෂණය - උපරිම ලකුණු 50

01. පරීක්‍ෂණ මණ්ඩලය මගින් විෂයයට අදළව ලබාදෙන මාතෘකාවක් යටතේ දේශනයක් පැවැත්වීම සඳහා වූ දේශන සටහන් පත්‍රයක් පිළියෙල කිරීම -25

02. එම සටහන් පත්‍රයේ සඳහන් කරුණුවලට අදළව දේශනයක් පරීක්‍ෂණ මණ්ඩලය ඉදිරියේ පැවැත්වීම -25

මුළු ලකුණු — 50

***ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 3 පන්තියට බඳවා ගැනීමේ ව්‍යුහගත හා ප්‍රායෝගික පරීක්‍ෂණ ලකුණු පරිපාටිය***

(තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ විෂයය සඳහා)

1 කොටස - ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය - උපරිම ලකුණු 50

01. අධ්‍යාපන සුදුසුකම් : — උපරිම ලකුණු 20

(උපලේඛනය 1හි සඳහන් සුදුසුකම්වලට අමතරව ලබා ඇති සුදුසුකම් සඳහා)
(උසස්ම සහතිකය සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)

| | | |
|---|---|---|
| 1.1 | ආචාර්ය උපාධිය (අධ්‍යාපන හෝ අදළ විෂයය පිළිබඳ) | - 20 |

1.2 පශ්චාත් උපාධිය - 15
(අධ්‍යාපන හෝ අදාළ විෂයය පිළිබඳ)
1.3 පශ්චාත් උපාධි ඩිප්ලෝමා - 10

02. ඉංග්‍රීසි භාෂා නිපුණතාවය උපරිම ලකුණු 10
(උපලේඛනය 1හි සඳහන් සුදුසුකම්වලට අමතරව ලබා ඇති සුදුසුකම් සඳහා)
(උසස්ම සහතිකය සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)
2.1 උපාධියට ඉංග්‍රීසි විෂයක් ලෙස හදරා තිබීම - 10
2.2 උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදරා තිබීම - 08
2.3 අ. පො. ස. (උ. පෙළ) ඉංග්‍රීසි විෂයක් ලෙස සමත්වීම - 06
2.4 අ. පො. ස. (උ. පෙළ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදරා තිබීම - 05
2.5 විශ්ව විද්‍යාලයක හෝ පිළිගත් ආයතනයක
ඩිප්ලෝමා පාඨමාලාවක් හදරා තිබීම (වසරක් හෝ ඊට වැඩි) - 04
2.6 පිළිගත් විශ්ව විද්‍යාලයක සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම - 02

03. ශාස්ත්‍රීය කාර්යසාධනය (අධ්‍යාපන ක්ෂේත්‍රයට අදළව) උපරිම ලකුණු 15
3.1 පර්යේෂණ හා නිබන්ධන
(උපාධිය/පශ්චාත් උපාධිය/පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ
ආචාර්ය උපාධිය සඳහා ඉදිරිපත් කල පර්යේෂණ හා නිබන්ධන
මේ යටතේ අදළ නොවේ) - 09
3.2 ප්‍රකාශන (ප්‍රසිද්ධ සඟරා හෝ පුවත්පත්වල පළවූ) - 06

04. සම්මුඛ පරීක්ෂණ කුසලතාවය උපරිම ලකුණු 05

මුළු ලකුණු 50

*II කොටස - ප්‍රායෝගික පරීක්ෂණය - උපරිම ලකුණු 50*

01. පරීක්ෂණ මණ්ඩලය මගින් විෂයයට අදළව ලබාදෙන
මාතෘකාවක් යටතේ දේශනයක් පැවැත්වීම සඳහා වූ
දේශන සටහන් පත්‍රයක් පිළියෙල කිරීම -25

02. එම සටහන් පත්‍රයේ සඳහන් කරුණුවලට අදළව
දේශනයක් පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ පැවැත්වීම -25

මුළු ලකුණු 50

**ආදර්ශ අයදුම්පත්‍රය**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ තනතුරු

(A4 ප්‍රමාණයේ කඩදසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කර ගත යුතුය. විෂයය ක්ෂේත්‍ර එකකට වඩා ඉල්ලුම් කරන්නේ නම් වෙන වෙනම ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය)

01. මුලකුරු සමග නම :————. (හිමි/මයා/මිය/මෙනෙවිය)

02. සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
සම්පූර්ණ නම :————.
(සිංහලෙන්)

03. රාජකාරි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
රාජකාරි ලිපිනය :————.
(සිංහලෙන්)

04. පෞද්ගලික ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
පෞද්ගලික ලිපිනය :————.
(සිංහලෙන්)

05. දුරකථන අංකය :————.

06. (i) උපන්දිනය :
අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

(ii) 2015.11.30 දිනට වයස
අවුරුදු :————. මාස :————. දින :————.

07. ජාතික හැඳුනුම්පත් අංකය :————.

08. මුල් පත්වීමේ දිනය හා තනතුර (දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටින්නන් සඳහා අදාළ වේ) :————.

09. වර්තමාන තනතුර පිළිබඳ විස්තර : (දැනට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ/ගුරු විද්‍යාලවල අනුයුක්ත පදනමින් හෝ ගුරු මධ්‍යස්ථානයන්හි වැඩබලන කළමනාකරුවන් වශයෙන් සේවය කරන අය පමණක් සම්පූර්ණ කළ යුතුය.)

(a) තනතුර :————.
(b) දෙපාර්තමේන්තුව :————.
(c) අනුයුක්ත වූ දිනය :————.
(d) ආයතනය/සේවා ස්ථානය :————.

10. අයදුම්කරන විෂයය

| විෂයය | ගැසට් නිවේදනයේ සඳහන් විෂයය අනු. අංකය | ගැසට් නිවේදනය අනුව සුදුසුකම් ලබන විෂයය අනු. අංකය (i) (ii) (iii) (iv) | මාධ්‍යය | ඉල්ලුම්කරන ලද ආයතන අනුපිළිවෙලින් |
|---|---|---|---|---|
| | | | | 1.<br>2.<br>3. |

11. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :

(i) උපාධි සුදුසුකම්

| උපාධියේ නම සහ නිකුත්කළ ආයතනය | වර්ෂය | පන්තිය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ii) පශ්චාත් උපාධි සුදුසුකම්

| නිකුත් කළ ආයතනය | සහතිකයේ නම | වර්ෂය …… සිට …… දක්වා | විෂයයන් | පන්තිය විශිෂ්ඨ/සම්මාන/සාමාන්‍ය යන වග |
|---|---|---|---|---|
| | | | | |

(iii) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව

| සහතිකයේ නම සහ නිකුත්කළ ආයතනය | වර්ෂය | අධ්‍යාපන ඩිප්ලෝමාවේ නම විශිෂ්ඨ ද/සම්මාන ද යන වග | විෂයය |
|---|---|---|---|
| | | | |

(iv) වෙනත් වෘත්තීය සුදුසුකම් (ඩිප්ලෝමා සහතික හා පුහුණු ගුරු සහතික පිළිබඳ විස්තර)

| සහතිකයේ නම සහ නිකුත් කළ ආයතනය | පාඨමාලා කාලය | විෂයයන් පිළිබඳ විස්තර |
|---|---|---|
| | | |

(v) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය

| අ. පො. ස. සා/පෙළ වර්ෂය | විශිෂ්ඨ ද/සම්මාන ද/ සාමාන්‍ය ද යන වග | වෙනත් | වර්ෂය | පන්තිය |
|---|---|---|---|---|
| | | | | |

| ලබා ඇති උසස්ම සහතිකය | නිකුත්කළ ආයතනය | ශ්‍රේණිය |
|---|---|---|
| | | |

(vi) සේවා විස්තර (කලින් දරන ලද තනතුරු හා එම තනතුරු දරූ කාලපරිච්ඡේදයන් දින වකවානු සහිතව සඳහන් කරන්න.)

| දෙපාර්තමේන්තුව | තනතුර | ස්ථිර ද/ තාවකාලික ද | සිට | දක්වා |
|---|---|---|---|---|
| | | | | |

12.

12.1 කිසියම් වරදකට උසාවියක දී ඔබ වරදකරුවෙක් වශයෙන් තීරණය කර තිබේ ද? (එසේ නම් විස්තර සඳහන් කරන්න.)

12.2 දැනට ඔබට විරුද්ධව දෙපාර්තමේන්තුමය විනයානුකූල පරීක්ෂණයක් පවත්වන්නේ ද ? නැතහොත් අධිකරණය ඉදිරියේ නඩුවක් විභාග වෙමින් පවතී ද? (එසේ නම් විස්තර සඳහන් කරන්න.)

12.3 මෙම ඉල්ලුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති සියළුම තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි දී ඇති තොරතුරු කිසියක් අසත්‍ය හෝ සාවද්‍ය බව අනාවරණය වුවහොත් ඒ මත මා මෙම තනතුර ලැබීමට නුසුදුස්සකු බවට තීරණය කරන බවත්, පත්වීම ලැබීමෙන් පසු මෙහි සඳහන් තොරතුරු කිසිවක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව අනාවරණය වුවහොත් මා කිසිම වන්දියක් නොලබා තනතුරින් පහකිරීමට යටත් වන බවත් දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන

දිනය :—————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

..............................ගේ ඉල්ලුම්පත ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් ............ වශයෙන් සේවය කරන බවත්, මේ තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

—————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව

දිනය :—————.

දෙපාර්තමේන්තුව :—————.

10-1172

## ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත දැක්වෙන සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතියට අනුව අයදුම්පත් "සර්වේයර් ජනරාල්, සර්වේයර් ජනරාල් කාර්යාලය, අංක 150, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05". යන ලිපිනයට 2015.11.30 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවාගැනීම සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුය. තැපෑලෙන් එවන අයදුම්පත් හැර වෙනත් ආකාරයෙන් එවන අයදුම්පත් භාරගනු නොලැබේ.

02. සියලුම අයදුම්කරුවන් පහත සඳහන් අවශ්‍යතා සපුරා ඇති බව සහතික විය යුතුය.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ආ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත හා ශාරීරික වශයෙන් යෝග්‍ය අයෙකු විය යුතුය.
(ඇ) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු සහ 33ට නොවැඩි විය යුතුය.
(ඈ) අයදුම්පත් කැඳවන අවසන් දිනට සියලු අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතු අතර ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් ඉල්ලුම්පත් ඉදිරිපත් නොකළ යුතුය.

03. සේවා කොන්දේසි :

(I) වැටුප්

මෙම තනතුරට අයත් ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත දැක්වේ.
රා.ප. චක්‍රලේඛ අංක 06/2006 (iv) MN-5-2006 A
රු. 16,720 - 10 x 320 - 11 x 365 - 15 x 450 - රු. 30,685

(II) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(III) රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලටද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1434/5 හා 2006.02.27 දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු සේවා ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසිවලටද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු සිදු කෙරෙන හෝ සංශෝධනවලට යටත්ව තෝරාගන්නා අපේක්ෂකයෙකු ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරට බඳවා ගනු ලැබේ.

04. පත්වීමේ කොන්දේසි :

(I) බඳවා ගනු ලබන නිලධාරීන් දෙපාර්තමේන්තු කටයුතු පිළිබඳ මූලික පුහුණුවක් සඳහා යොදවනු ලැබේ.

(II) බඳවා ගනු ලබන නිලධාරීන්ට ලබාදෙන රජයේ ගබඩා භාණ්ඩ වෙනුවෙන් රු. 25,000ක මුදල් ඇපයකට බැඳිය යුතුය.

(III) පුහුණු කාලයෙන් පසුව ඉදිරියට තවත් අවුරුදු 06ක කාලයක් ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ මිනින්දෝරුවරයෙකු වශයෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට ඔවුන් යටත් වන අතර ඒ සඳහා රු. 1,50,000කට නො අඩු වත්කම් ඇති ඇපකරුවකු සමඟ ගිවිසුමකට හා ඇප ඔප්පුවකට ඔවුන් ඇතුළත් විය යුතුය.

(IV) බඳවා ගැනීමෙන් පසු ලබා දෙන මූලික පුහුණුවෙන් අනතුරුව පවත්වනු ලබන ලිඛිත විභාගයේ ලකුණු මත තෝරා ගත් නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය තීරණය කරනු ලැබේ.

05. අධ්‍යාපන සුදුසුකම් :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් මැනුම් විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබිය යුතුය.

06. තෝරාගැනීමේ ක්‍රමය :

සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ. අයදුම්කරුවන් අතරින් අදාළ සුදුසුකම් සපුරා ඇති සියලුම මැනුම් විද්‍යා උපාධිධාරීන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවන අතර, එවිට පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් සහ ඒවායේ ඡායා පිටපත් කට්ටලයක් සමඟ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය යුතුය.

(i) උප්පැන්න සහතිකය.
(ii) උපාධි සහතිකය ඇතුළු සෙසු අධ්‍යාපන සහතික.
(iii) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(iv) චරිත සහතික දෙකක් .- මෙයින් එකක් ප්‍රාදේශීය ලේකම් අනුඅත්සන සහිත ග්‍රාම නිලධාරී සහතිකයක් විය යුතුය.

07. අවශ්‍ය කොන්දේසි සපුරා නොමැති හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. අයදුම්කරුවෙකුට නියමිත සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවකදී ඔහුගේ පත්වීම අවලංගු කරනු ලැබේ.

09. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නිලධාරියෙකු නම් තම අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරුවන් තැපෑලෙන් එවන අයදුම්පත් නැතිවීම ගැන වගකීම් භාරගනු නොලැබේ.

10. මෙම බඳවා ගැනීමේ කටයුතු කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ සම්පූර්ණ බලය සහ බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය සර්වේයර් ජනරාල් සතුවේ. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ වල අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය වලංගු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි,

පී. එම්. පී. උදයකාන්ත,
සර්වේයර් ජනරාල්,
ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව.

2015 ඔක්තෝබර් මස 15 වැනි දින,
අංක 150,
කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

### ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත

01. නම :————.

1.1 මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) *උදා :* SILVA, A. B.
1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
1.4 ජාතික හැඳුනුම්පත් අංකය :————.
1.5 නිකුත් කළ දිනය :————.

02. ලිපිනය ඃ

2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.3 ලිපි එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. දුරකථන අංක ඃ
ජංගම :————. ස්ථාවර :————.

04. පුරවැසිභාවය :————.
(පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ද යනවග සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් ලියාපදිංචි අංකය සඳහන් කරන්න.)

05. ස්ත්‍රී පුරුෂ භාවය ඃ

ස්ත්‍රී 1, පුරුෂ 0

(අදාළ කොටුව තුළ අංකය ලියන්න)

06. විවාහක/අවිවාහක භාවය :————.

07. උපන් දිනය ඃ
වර්ෂය :————. මාසය :————. දිනය :————.

7.1 ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනයට වයස ඃ
අවුරුදු :————. මාස :————. දින :————.

08. අධ්‍යාපන සුදුසුකම් ඃ

(i) විශ්වවිද්‍යාලය/ආයතනය :————.
(ii) උපාධිය හා සමත් වූ වසර :————.
(iii) ලියාපදිංචි වූ අංකය හා දිනය :————.
(iv) බාහිර/අභ්‍යන්තර :————.
(v) විභාග අංකය :————.
(vi) පන්තිය (ඉහළ/පහළ) :————.
(vii) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.

09. පරිගණක විද්‍යාව පිළිබඳ හදාරා ඇති පාඨමාලා විස්තර :————.

10. මව් භාෂාවට අමතරව වෙනත් භාෂාවන්ගේ දැනුම සහ සමත්ව ඇති විභාග :————.

11. වෙනත් කුසලතා සහ සුදුසුකම් :————.

12. කිසියම් චෝදනාවක් සම්බන්ධයෙන් ඔබ උසාවියෙන් වරදකරු වී ඇත්නම් ඒ හා සම්බන්ධ සියලුම විස්තර දැන්විය යුතු ය. :————.

13. ඔබ දැනට රජයේ සේවයේ නියුතු අයෙකු නම් අයදුම්පත් භාරගන්නා දිනට වැඩ තහනමකට ලක්ව තිබේ ද යන්න :————.

මා විසින් ඉහතින් ඉදිරිපත් කර ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති විස්තර කිසිවක් වැරදි හෝ අසත්‍ය බැව් අනාවරණය වුවහොත් තෝරා ගැනීමට සලකා බලනු නොලබන බවත් හා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් මම හොඳාකාරව දනිමි. තව ද මේ සම්බන්ධයෙන් පළ කරන ලද ගැසට් නිවේදනයේ සඳහන් සියලු කොන්දේසිවලට මා එකඟ වන බව ද ප්‍රකාශ කරමි.

..........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණක් මෙම කොටස අදාළ වේ.)

...............................
...............................
...............................

සර්වේයර් ජනරාල්,

මෙම ආයතනයේ සේවය කරන ඉහත සඳහන් ..................................... මහතා/මහත්මිය/මෙනවිය ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදිය. ඔහු/ඇය කිසියම් විනයානුකූල දඬුවමකට භාජනය කර නොමැති අතර මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් නිදහස් කරනු හැකිය./නොහැකිය.

................................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන,
නිල මුද්‍රාව.

දිනය :————.

10 - 1148

---

## ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

### II වැනි ශ්‍රේණියේ සුරාබදු රියදුරු තනතුර

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ සුරාබදු රියදුරු තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආදර්ශ ඉල්ලුම්පත්‍ර ප්‍රකාර සකස් කරගත් ඉල්ලුම්පත්‍ර 2015.11.30 වැනි දින හෝ ඊට පෙර "සුරාබදු කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, අංක 34 ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''සුරාබදු රියදුරු තනතුර'' යනුවෙන් සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ ඉල්ලුම්පත්‍ර මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

03. *මාසික වැටුප් ක්‍රමය* :- II වැනි ශ්‍රේණිය ඃ රු. 12,470-130x10-145x10-160x10-170x12- රු. 18,860 ක් වේ. රු. 13,915 ක් වූ මාසික වැටුප මත පිහිටුවනු ලැබේ. (රා. ප. ච. 6/2006 (iv) ට අනුව PL3-2006A) උක්ත වැටුප් ක්‍රමයේ රු. 14,350 වැටුප් තලය ඉක්මවා යාමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉමකි).

04. *වයස් සීමාව* ඃ ගැසට් නිවේදනය අනුව ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත ඉල්ලුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලනොපායි.)

05. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-*

(i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ හා වෙනත් විෂයකටවත් සම්මාන සාමාර්ථ සහිතව ගණිතය ඇතුලුව විෂයයන් හයක් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වී තිබීම

(iii) වලංගු මෝටර් රථ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු වසර 03 ක සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතු ය. (සහතික පත් මගින් එය සනාථ කළ යුතු ය.)

(iv) ඉල්ලුම්කරු යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය. (ඉල්ලුම්කරුගේ චරිතය පිළිබඳව ජාතික තොරතුරු මධ්‍යස්ථානය/පළාතේ පොලීසිය/සුරාබදු ස්ථානවලින් පරීක්ෂා කර බලනු ලැබේ)

(v) දිවා කාලයේ දී මෙන්ම රාත්‍රී කාලයේ දී ද සේවය කිරීමට සුදුසු ඇස් පෙනීමකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට තරම් සුදුසු ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.

(vi) උස අවම වශයෙන් 5' 4" ක්ද, ප්‍රශ්වාසයේ දී පපුව අවම ප්‍රමාණය 32" ක් ද විය යුතු ය.

(vii) මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් හා මෝටර් කාර්මික දැනුමක් තිබිය යුතු ය. මෝටර් බස් රථ, මෝටර් කෝච් 'A' පන්තිය පැදවීම සඳහා (බර වාහන පැදවීමේ ප්‍රවීණතා සහතිකය) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු සහතිකයක් ඇත්තකු විය යුතු ය.

06. *බඳවා ගන්නා ක්‍රමය :-* ඉහත 4, 5 ඡේදවල සඳහන් සුදුසුකම් සපුරාලන ඉල්ලුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන අතර, අපේක්ෂකයන්ගේ සහතික/බලපත්‍ර හා මෝටර් කාර්මික දැනුම පිළිබඳව පරීක්ෂා කර බලනු ලැබේ. සුදුසුකම් ඇති අය සඳහා ප්‍රායෝගික ධාවන පරීක්ෂණයක් පවත්වනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් පිළිබඳව පොලිස් වාර්තා සහ සුරාබදු පරීක්ෂණ වාර්තා ලබාගැනීමෙන් පසුව පවත්නා පුරප්පාඩු අනුව II වැනි ශ්‍රේණියේ සුරාබදු රියදුරන් ලෙස පත්වීම් දීම පිණිස තෝරා ගන්නවා ඇත. බඳවා ගැනීම පිළිබඳව රජයේ ප්‍රතිපත්ති හා කොන්දේසි අනුගමනය කරනු ලැබේ. තෝරාගත් ඉල්ලුම්කරුවන්ට දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු පිළිබඳ දෙසතියක පුහුණුවක් දෙනු ලැබේ.

07. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :-* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු, අනත්දරු, විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මෙම තනතුර සුරාබදු දෙපාර්තමේන්තුවේ නියෝග යටතේ පාලනය වන නිළ ඇඳුම (යුනිෆෝම්) අඳින තනතුරකි.

08. ඉල්ලුම්කරුවන් පහත දැක්වෙන ලිපිලේඛනවල ඡායා පිටපත් (මුල් පිටපත් නොවේ.) ස්වකීය ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතු ය.

(i) උප්පැන්න සහතිකය
(ii) චරිතය පිළිබඳව මෑත දී ලබාගත් චරිත සහතික 02ක්. ඉන් එකක් තමා ස්ථිරව පදිංචි ප්‍රදේශයේ ග්‍රාම සේවා නිලධාරියාගෙන්/ ප්‍රාදේශීය ලේකම් වෙතින් ලබාගත් චරිත සහතිකයක් විය යුතු ය.
(iii) අධ්‍යාපන සුදුසුකම් තහවුරු කිරීම සඳහා වූ සහතික
(iv) මෝටර් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කළ වලංගු සහතිකය
(v) විශේෂ සුදුසුකම් තහවුරු කෙරෙන පිළිගත හැකි සහතික.

09. සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන ඉල්ලුම්කරුවන්ට ඒ බැව් ලිඛිතව දන්වනු ලැබේ. මේ සඳහා ගමන් වියදම් ආදිය ගෙවනු නොලැබේ.

එල්. කේ. ජී. ගුණවර්ධන,
සුරාබදු කොමසාරිස් ජනරාල්.

දිනය : 2015.10.21

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

*ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු රියදුරු තනතුර II වැනි ශ්‍රේණිය*

01. (අ) සම්පූර්ණ නම (මව්බසින්) :————.
(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසියෙන්) :————.
(කැපිටල් අකුරු භාවිතා කරන්න)
(ඇ) මුලකුරු සමඟ නම :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. වර්තමාන ලිපිනය :————.
(අ) ස්ථිර පදිංචි ලිපිනය :————.
(ආ) පොලිස් ස්ථානය :————.

04. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියකු ද යන වග : නැතහොත් පරම්පරාවෙන් ද/ලියාපදිංචි වීමෙන් ද යන වග (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න)

05. විවාහක/අවිවාහක බව :————.

06. උපන් දිනය :
අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

07. ගැසට් නිවේදනය අනුව ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස :
අවුරුදු :————. මාස :————. දින :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න.)

08. අධ්‍යාපන සුදුසුකම් (සමත්වී ඇති විභාගයන් සඳහන් කරමින් සහතික පිටපත් අමුණන්න.)

09. (i) ගැසට් නිවේදනයේ 5 වැනි ඡේදයේ III අනුව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ විස්තර සඳහන් කරන්න.
(ii) ගැසට් නිවේදනයේ 5 වැනි ඡේදයේ VII අනුව අදළ සහතිකය නිකුත් කළ අය : (සහතික පිටපත අමුණා එවන්න.)

10. පපුවේ ප්‍රමාණය (ආශ්වාස නොකර) සෙ. මී. :————. අඟල් :————.

11. උස : සෙ. මී. :————. අඩි :————. අඟල් :————.

12. ඉල්ලුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම්, තනතුරු හා ලිපිනය

(i) ............................................................
............................................................
............................................................
(ii) ............................................................
............................................................
............................................................

13. ඔබ මීට පෙර රජයේ/පළාත් රාජ්‍ය සේවයේ කිසියම් තනතුරක් ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර, එම තනතුරෙන් ඉවත්වී ඇත්නම් ඊට හේතු සඳහන් කරන්න. :————.

14. වර්තමාන තනතුර හා සේවා ස්ථානය :————.

මා විසින් සපයා ඇති ඉහත සඳහන් විස්තර මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කර සහතික කරමි. එසේම ඉහත සඳහන් කරන ලද තොරතුරු වැරදි හෝ අසත්‍ය ඒවා බව පසුව හෙළිවුවහොත් මා සේවයට පත් කර ගෙන ඇතත් එම පත්වීම කිසිම වන්දියක් නොමැතිව අවසන් කිරීමට යටත් වන බවත් මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10-1201

## රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ (PL-3-2006A) වැද්දුම්කරු තනතුරට බඳවා ගැනීම (විවෘත) සඳහා අයදුම්පත් කැඳවීම

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ (PL-3-2006A) වැද්දුම්කරු තනතුරට බඳවා ගැනීම (විවෘත) සඳහා සුදුසුකම් සහිත අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. තනතුරට අයත් වැටුප් ක්‍රමය හා වැටුප් කේත අංකය :
මසකට රු. 12,470-10x130-10x145-10x160-12x170- රු. 18,860 ක වැටුප් පරිමාණයක් මෙම තනතුරට හිමිවේ. (PL-3-2006-A)

03. තනතුරේ ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

04. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

05. තනතුරට අදාළ කාර්යයන් :

(i) ඇණ, මුරිච්චි, යකඩ බාර්වල පොට කැපීම, විදීම, පීරිගෑම, මුද්‍රණ යන්ත්‍ර කොටස් අළුත්වැඩියා කිරීම.
(ii) දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකි වෙනත් රාජකාරි.

06. සුදුසුකම් :

6.1 අධ්‍යාපන සුදුසුකම් -

6.1.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හය (06) කින් සමත්වීම,

6.2 වෘත්තීය සුදුසුකම් -

6.2.1 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක තනතුරට අදාළ ක්ෂේත්‍රය යටතේ ප්‍රවීණතාවයක් අත්කරගෙන තිබිය යුතු ය.

6.3 කායික සුදුසුකම් -

6.3.1 සෑම අයදුම්කරුවෙකුම තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

6.4 වෙනත් සුදුසුකම් -

6.4.1 අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.
6.4.2 අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
6.4.3 අයදුම්කරුවන් වයස අවු. 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතු ය.

6.4.4 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

07. බඳවා ගැනීමේ ක්‍රමය :

අයදුම්කරුවන් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට හා තනතුරට අදාළ ප්‍රායෝගික දැනුම හා කුසලතාව මැන බැලෙන ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත්වීම සඳහා 40% ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු අතර සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණයේදී ලකුණු ලබාගත් අනුපිළිවෙල මත ඉහලම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරු වලට බඳවාගනු ලැබේ.

08. ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු ව්‍යුහය හා විෂය නිර්දේශය පහත පරිදි වේ :

8.1 ලකුණු ව්‍යුහය -

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. ක්ෂේත්‍රයට අදාළ මූලික දැනුම | 25 | |
| 2. උපකරණ සවිකිරීම, අළුත්වැඩියා කිරීම, භාවිතා කිරීම හා දෝෂ හඳුනා ගැනීම පිළිබඳ දැනුම | 25 | 40 |
| 3. ක්ෂේත්‍රයට අදළ උපකරණ භාවිතා කරමින් දෙන ලද නිර්මාණයක්/ඉදිකිරීමක්/සවිකිරීමක් අළුත්වැඩියා කිරීමක් වැනි කාර්යයක් නියමිත කාලයක් තුලදී ඉටුකිරීමේදී දක්වනු ලබන දක්‍ෂතාවය/කුසලතාවය පරීක්‍ෂා කිරීම | 50 | |
| එකතුව | 100 | |

8.2 විෂය නිර්දේශය :

(i) 1/32 පරිමාණයන් කියවීමට හැකියාව
(ii) වෘත්තියේදී භාවිතා වන ආයුධවල නම්, ඒවා භාවිතය සහ තබා ගැනීම පිළිබඳ දැනීම
(iii) පී/ටී කිරීම පිළිබඳ දැනීම
(iv) සැසීමට හා පීරිගෑමට හැකිවීම

09. තනතුරෙහි ස්ථිර කිරීම :

III පංතියේ III ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරියෙකු වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වේ. එසේ පත්කරනු ලබන අයදුම්කරුවෙකු පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය සමත්වීම සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014 හි විධිවිධාන පරිදි භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ඇත්නම් හා පරිවාස කාලය තුළ සිය රාජකාරි, වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කරනු ලැබේ.

10. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :

10.1 අයදුම්පත් කැඳවන අවසාන දිනය 2015.11.30 වේ.

10.2 අයදුම්පත් මේ සමඟ ඇති ආකෘතියට අනුව සකස්කර, නිසි ලෙස සම්පූර්ණ කර ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ ''වැද්දුම්කරු තනතුරට බඳවා ගැනීම (විවෘත) සඳහා අයදුම්පත'' ලෙස සඳහන් කර 2015.11.30 දිනට පෙර ''රජයේ මුද්‍රණාලයාධිපති, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ 08'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කළ යුතු ය.

11. මෙහි සඳහන් නොවන වෙනත් කරුණු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණය (PL-3-2006A) සඳහා වන බඳවාගැනීමේ පරිපාටිය අනුව තීරණය වේ.

12. මෙම සේවා ව්‍යවස්ථාව යටතේ බඳවා ගනු ලබන සියලුම නිලධාරීහු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධානවලට හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවන්නා වූ නියෝග, 'රෙගුලාසි' හා කාර්ය පටිපාටික රීති වලට, දෙපාර්තමේන්තු විධිවිධානවලට ද, රජය විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් විධි විධාන හා නියෝග වලටද අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටිති.

13. මෙම දැන්වීමෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවත්විය යුතු වන්නේ ය.

ඩබ්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.).

2015 ඔක්තෝබර් මස 26 වැනි දින.

### රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ (PL-3-2006A) වැද්දුම්කරු තනතුරට බාහිර බඳවා ගැනීම සඳහා වන අයදුම්පත්‍රය

1. සම්පූර්ණ නම :—————.

2. මුලකුරු සමඟ නම
   (i) සිංහලෙන් :—————.
   (ii) ඉංග්‍රීසියෙන් :—————.

3. ලිපිනය :—————.

4. උපන් දිනය :—————.

5. 2015.11.30 දිනට වයස : අවු. :———. මාස :———. දින :———.

6. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.

7. විවාහක/අවිවාහක බව :—————.

8. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

9. දුරකතන අංකය :—————.

10. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන බව :—————.

11. අධ්‍යාපන සුදුසුකම් :

අ. පො. ස. සා/පෙළ

විභාග අංකය :—————. පෙනී සිටි වසර :—————.

| | |
|---|---|
| (i) :—————. | (vi) :—————. |
| (ii) :—————. | (vii) :—————. |
| (iii) :—————. | (viii) :—————. |
| (iv) :—————. | (ix) :—————. |
| (v) :—————. | (x) :—————. |

වෙනත් අධ්‍යාපන සුදුසුකම් (තිබේ නම්)
.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................

12. පිළිගත් ආයතනයක සේවා පළපුරුද්ද (තිබේනම්) :—————.

.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................

13. වෘත්තීය සුදුසුකම් :—————.

(i) වැද්දුම් ශිල්පයට අදාළව NVQ ප්‍රවීණතා සහතිකය ලබා තිබේ ද? :—————.

(ii) එසේ ලබා තිබේනම් ඒ කුමන මට්ටම ද? :—————.

(iii) වෙනත් වෘත්තීය සුදුසුකම් :

.....................................................................
.....................................................................
.....................................................................
.....................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තව ද මෙහි දැක්වෙන යම් කරුණක් අසත්‍ය බව සනාථ වුවහොත් මා මෙම තනතුර සඳහා සුදුස්සෙකු නොවන බව ද, තනතුරෙන් ඉවත්වීමට ද සිදුවන බව ද මා හොඳාකාරවම දන්නා බව ද මෙයින් ප්‍රකාශ කර සිටිමි.

..............................
අයදුම්කරුගේ අත්සන.

දිනය :...............

14. *දැනටමත් රජයේ සේවයේ තනතුරක් දරන අයදුම්කරුවන් පමණක් මෙහි පහත සඳහන් කොටස සම්පූර්ණ කළ යුතු ය.*

ඉහත 1 සිට 13 දක්වා වූ තොරතුරු නිවැරදි බවත්, මෙම නිලධාරියා/නිලධාරිනිය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබා ඇති බවත් සහතික කරමි. තව ද මෙම නිලධාරියා/නිලධාරිනිය මෙම තනතුර සඳහා තේරී පත්වුවහොත් දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදාහැරිය හැකිය/නොහැකිය.

..............................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය.

දිනය :...............

15. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

(අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසල් ප්‍රධානියකු/විශ්‍රාමික ප්‍රධානියකු/කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයකු දිවුරුම් කොමසාරිස්වරකු නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු රු. 240,360 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික සේවයේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයෙකු ලවා සහතික කරවා ගත යුතු ය.)

ඉහතින් අත්සන් කර ඇති ........................ මයා./මිය. මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් යෙදූ බවත් මෙයින් සහතික කරමි.

..............................
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :—————.

නම :—————.

නිල නාමය :—————.

ලිපිනය :—————.

10-1202

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015
## (කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව)

අංක 1930/12 හා 2015.09.01 දිනැති රජයේ අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුකූලව යථෝක්ත පාඨමාලාව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මගින් 2016 මාර්තු මස ආරම්භ කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම පාඨමාලාව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ දී ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලබන අතර, පාඨමාලාවට නිලධාරීන් තෝරා ගැනීම, පාඨමාලාව පැවැත්වීම, විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම, පාඨමාලා සහතික නිකුත් කිරීම හා සහන කාල ලබාදීම සම්බන්ධයෙන් එම පීඨයේ පීඨාධිපති විසින් නියම කරන ලද නීති රීතිවලට පාඨමාලා අපේක්ෂකයන් යටත් වේ. විශ්වවිද්‍යාලය විසින් පනවනු ලබන නීති රීති උල්ලංඝනය කළහොත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් පනවනු ලබන දඬුවමකට හා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්වීමට ඔවුනට සිදුවෙනු ඇත.

(ii) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් පනවනු ලබන නීතිරීති, හා පාඨමාලාව සම්බන්ධව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් පාඨමාලාව ආරම්භයේ දී ඔබව දැනුවත් කරනු ඇත.

03. මෙම පාඨමාලාව සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රය මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂක/අපේක්ෂිකාවන් ස්වකීය අයදුම්පත්‍ර පිළියෙල කරගත යුතු අතර, ඒ අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ මධ්‍යම රජයේ නිලධාරියෙකු නම්, තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ද, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු නම්, ඔවුන් සේවය කරන පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් මගින් ද, 2015 නොවැම්බර් මස 30 දින නොඉක්මවා, "පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන හා වානිජ විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ" යන ලිපිනය වෙත තම අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015 (කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව) ලෙස සඳහන් විය යුතු ය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් කිසිදු පරීක්ෂණයකින් තොරව ප්‍රතික්ෂේප කිරීමට පීඨාධිපති වෙත බලය පිරිනමනු ලැබේ.

04. *අනන්‍යතාවය :*

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපති සෑහීමකට පත් වන ලෙස තම අනන්‍යතාව අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පාඨමාලා ආරම්භයේ දී හා පාඨමාලා කාලය තුළ අවශ්‍යතාවය මත ඉදිරිපත් කිරීමට අපේක්ෂකයන් විසින් ළඟ තබා ගත යුතු ය.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය.

(*ආ*) තම ආයතනය විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රය;

*හෝ*

තම ආයතනය විසින් නිකුත් කරන ලද අනන්‍යතාවය තහවුරු කළ හැකි ලේඛනයක්

05. *අයදුම්පත්‍රය :*

(i) ''ඒ4'' ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රය පිළියෙල කළ යුතු ය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර පිළියෙල කරගත හැකි වුව ද, එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින් පිරවිය යුතු අතර විශේෂයෙන්ම සඳහන් කර ඇති අවස්ථාවල දී පමණක් විශේෂයෙන් සඳහන් කර ඇති භාෂාවෙන් අයදුම්පත පිරවිය යුතු ය. අයදුම්පතේ සඳහන් පරිදි නිලධාරීන්ගේ නම පාඨමාලාවේ සියලු අවස්ථාවලදී භාවිතා කරන බැවින් ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු ය. යම් හෙයකින් එම තොරතුරු පාඨමාලා කාලය තුළ වෙනස්වුවහොත් ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ලිඛිතව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා වෙත දැනුම් දිය යුතු ය.

(ii) ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) අයදුම්කරු විසින් අයදුම්පතේ මුල්පිටේ දකුණත් පස ඉහළ කෙළවරේ සපයා ඇති කොටුව තුළ තැපැල් මුද්දරයක ප්‍රමාණයේ ඡායා රූපයක් ඇලවිය යුතු වන අතර තවත් තැපැල් මුද්දරයක ප්‍රමාණයේ ඡායා රූපයක් අයදුම්පත සමඟ අමුණා තිබිය යුතු ය.

06. *පාඨමාලා ගාස්තු හා විභාග ගාස්තු :*

(i) මෙම පාඨමාලාව සඳහා පෙනී සිටින නිලධාරීන් විසින් රු. 17,500.00 ක මුදලක් මහජන බැංකුව, ගංගොඩවිල ශාඛාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨ සංවර්ධන අරමුදල් ජංගම ගිණුම් අංක 097100140002229 නමට සේවා නියුක්ත ආයතනය මගින් එවනු ලබන චෙක්පතකින් හෝ බැංකු අණකරයකින්, අදාළ අයදුම්කරු විසින් මුදල් තැන්පත් කර, ලබාගත් රිසිට්පත ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨාධිපති කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා වෙත පාඨමාලාව සමාරම්භක දිනයට සතියකට පෙර ඉදිරිපත් කළ යුතු ය. මෙම මුදල සඳහා ආයතනික ගාස්තු, මුද්‍රණ ගාස්තු, විභාග ගාස්තු, සම්පත්දායක දීමනා, සම්බන්ධීකරණ ගාස්තු ඇතුළත් වේ.

(ii) එසේ වුවත් මුල් අවස්ථාවේ දී පාඨමාලාවට අදාළ විභාග සම්පූර්ණ කිරීමට අපොහොසත් වුවහොත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විභාගයට පෙනී සිටින්නේ නම් විභාග සඳහා ලියාපදිංචි ගාස්තු ලෙස රු. 1,000 ක ගාස්තුවක් ද, එක් විෂයයක් සඳහා පෙනී සිටීම සඳහා රු. 2,000 ක ගාස්තුවක් ද, ගෙවිය යුතු ය. එම ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපතිගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

(iii) කවර හේතුවක් යටතේ වුව ද මෙම පාඨමාලාව සඳහා අයකරන කිසිදු ගාස්තුවක් ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් හෝ පාඨමාලාවක් හෝ නිලධාරියකු සඳහා මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.

07. *පාඨමාලාව හැදෑරීමේ අවශ්‍යතාවය :*

(i) ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ I ශ්‍රේණියට උසස්වී වසර පහක් (05) ගතවීමට පෙර සියලු නිලධාරීන් ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන III වන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය සමත් විය යුතු ය.

(ii) 2013.06.01 දිනය වන විට ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ I ශ්‍රේණියට උසස්වී වසර පහක් (05) සම්පූර්ණ කර ඇති නිලධරයන් III වන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

*සටහන.*—දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඒ ඒ නිලධාරියාගේ ජ්‍යෙෂ්ඨතාවය හා ඉහත 07. i, 07. ii ඡේදවල කරුණු සම්බන්ධයෙන් තම අවධානය යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

08. *පාඨමාලාව සඳහා තෝරාගැනීම :*

ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ I ශ්‍රේණියට උසස් වූ නිලධාරීන්ගේ එම ශ්‍රේණියට පත්වූ ජ්‍යෙෂ්ඨතාවය අනුපිළිවෙල අනුව පාඨමාලාව සඳහා නිලධාරීන් තෝරා ගැනීමේ දී ප්‍රමුඛතාවය ලබා දේ.

09. අයදුම්පත් එවා ඇති සියලුම නිලධාරීන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපති පවත්වාගෙන යනු ලබන දත්ත පද්ධතියට ඇතුළත් කරන අතර වරකට 200 කණ්ඩායම් 2 බැගින් වසරකට 800 දෙනෙකු මෙම පාඨමාලාවට සහභාගි කරවා ගනු ලබයි. පාඨමාලාව සඳහා සහභාගිවීමට තෝරාගත් අයදුම්කරුවන්ගේ නාම ලේඛනයක් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය වෙත එවනු ඇත. ඉන් අනතුරුව ලිපි මගින් අදාළ අයදුම්කරුගේ දෙපාර්තමේන්තුව දැනුවත් කිරීම අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබයි. පාඨමාලාව සඳහා ප්‍රමාණවත් පිරිසක් නොමැති අවස්ථාවක දී පමණක් නැවත *ගැසට්* නිවේදනයක් මගින් මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලබයි.

10. පාඨමාලාවේ විෂය නිර්දේශය :

| *අනු. අංකය* | *විෂය නිර්දේශය* | *ක්‍රෙඩිට් ගණන* | *ක්‍රෙඩිට් පැය* |
|---|---|---|---|
| 01 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 02 | 30 |
| 02 | මානව සම්පත් කළමනාකරණය (මූලික සිද්ධාන්ත) | 02 | 30 |
| 03 | ගැටුම් කළමනාකරණය (සංවිධානයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමේ දී ගැටුම් කළමනාකරණ සිද්ධාන්තවල ප්‍රයෝගික භාවිතය) | 02 | 30 |
| 04 | සංවිධාන චර්යාව | 02 | 30 |
| 05 | ව්‍යාපෘති වාර්තාව තමන්ගේ වෘත්තීය ක්‍ෂේත්‍රය සම්බන්ධයෙන් මතු වන ගැටළුවක් හෝ වෘත්තීය ක්‍ෂේත්‍රය පිළිබඳ පර්යේෂණාත්මක නිබන්ධනයක් | 02 | 30 |
| | | 10 | 150 |

11. මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

ජේ. දඩල්ලගේ,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2015 ඔක්තෝබර් මස 14 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

(ගැසට් නිවේදනය හා ආදර්ශ අයදුම්පත්‍රය www.pubad.gov.lk වෙතින් භාගත කරගත හැක.)

ආදර්ශ අයදුම්පත්‍රය

| තැපැල් මුද්දරයක ප්‍රමාණයේ ඡායා රූපයක් මෙතැන අලවන්න. |
|---|

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015**
(කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව)

01. (අ) මුල්අකුරු අගට යොදා මුල්අකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : GUNAWARDHANA, M. G. B. S. K.

(ආ) සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ඇ) මුල්අකුරු සමඟ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. ඔබ අයත් වන්නේ පළාත් රාජ්‍ය සේවයට ද, එසේ නොමැති නම් කුමන රාජ්‍ය සේවයට ද යන වග අදාළ අංකය කොටුව තුළ ලියන්න.

(රාජ්‍ය සේවය - 10/බස්නාහිර පළාත් රාජ්‍ය සේවය - 01/මධ්‍යම පළාත් රාජ්‍ය සේවය - 02/දකුණු පළාත් රාජ්‍ය සේවය -03/උතුරු පළාත් රාජ්‍ය සේවය - 04/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවය - 05/ වයඹ පළාත් රාජ්‍ය සේවය - 06/උතුරුමැද පළාත් රාජ්‍ය සේවය 07/ඌව පළාත් රාජ්‍ය සේවය 08/සබරගමුව පළාත් රාජ්‍ය සේවය 09)

03. තනතුරු නාමය :————.

04. ඔබ අයත්වන උප දෙපාර්තමේන්තුව/අංශය :————.

05. ඔබ අයත්වන දෙපාර්තමේන්තුව :————.

06. රාජකාරි ලිපිනය :
:————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
:————.
(සිංහලෙන්/දෙමළෙන්)

07. පෞද්ගලික ලිපිනය :————.

08. විද්‍යුත් තැපෑල :————.

09. දුරකථන අංකය :
පෞද්ගලික :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

රාජකාරි :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

10. ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - M
ස්ත්‍රී - F (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

11. ජාතික හැඳුනුම්පත් අංකය :

(තමන් විසින් සත්‍ය පිටපතක් බවට අනු අත්සන් කළ ජාතික හැඳුනුම්පතේ පිටපතක් අමුණන්න.)

12. (i) උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

(ii) I ශ්‍රේණියට උසස් වූ දිනය : අවු. : මාස : දින :

(iii) අයදුම්පත් කැඳවන දිනට I ශ්‍රේණියේ සක්‍රීය සේවා කාලය : අවු. : මාස : දින :

(තමන් විසින් සත්‍ය පිටපතක් බවට අනු අත්සන් කළ I ශ්‍රේණියට උසස්වීම් ලැබූ ලිපියේ පිටපත ඇමුණුමක් ලෙස ඉදිරිපත් කරන්න.)

(iv) 2013.06.01 වැනි දිනට I ශ්‍රේණියේ සේවා කාලය : අවු. : මාස : දින :

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, තව ද පාඨමාලව පැවැත්වීම, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපති විසින් පනවනු ලබන නීති රීතිවලට හා ආයතන සංග්‍රහයේ නීතිරීති වලට යටත්වන බව ද ප්‍රකාශ කරමි.

_________,
අපේක්ෂකයා/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :_________.

*අත්සන සහතික කිරීම*

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ............... මහතා/මහත්මිය/මෙනෙවිය ........... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

_________,
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන හා නිලමුද්‍රාව.

දිනය :_________.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

ඉහත අංක 01 සිට 12 තෙක් ඡේදවල අඩංගු තොරතුරු නිවැරදි බවත් 07 ඡේදයේ සටහනට අනුව මෙම අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම පාඨමාලාවට සහභාගී වීමට සුදුසුකම් සහිත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධරයකු බවත්, නියමිත පාඨමාලා ගාස්තු ගෙවීමට දෙපාර්තමේන්තුවට හැකියාව පවතින බවත් සහතික කරමි.

_________,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව.

දිනය :_________.

*පිරික්සුම :*

1. තමන් විසින් සත්‍ය පිටපතක් බවට අනු අත්සන් කළ ජාතික හැඳුනුම්පතේ පිටපතක් අමුණා ඇත.
2. මුද්දරයක ප්‍රමාණයේ ඡායාරූපයක් අයදුම්පත ඉහල දකුණත් කෙළවරේ අළවා ඇත.
3. මුද්දරයක ප්‍රමාණයේ ඡායා රූපයක් අයදුම්පත සමඟ අමුණා ඇත.
4. I ශ්‍රේණියට උසස්වීම් ලැබූ ලිපියේ තමන් විසින් සත්‍ය පිටපතක් බවට අනු අත්සන් කළ ලිපිය අමුණා ඇත.

10-1101

**කෘෂිකර්ම අමාත්‍යාංශය**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2015**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවාවේ කෘෂිකර්ම උපදේශක/පර්යේෂණ සහකාර තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන විවෘත/සීමිත තරග විභාගයට පහත සඳහන් සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ. අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2015 නොවැම්බර් මස 20 වේ.

02. 1 - *විවෘත පදනම මත බඳවා ගැනීම* :

02.1.1 අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2015 නොවැම්බර් මස 20 වැනි දිනට අයැදුම්කරුවන්ගේ වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, 30ට නොවැඩි විය යුතු ය. ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම් සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 1997.11.20 වැනි දින හෝ ඊට පෙර හා 1985.11.20 වැනි දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි. දැනටමත් රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

02.1.2 විභාගයට ඉදිරිපත් වන අපේක්‍ෂක අපේක්‍ෂිකාවන් පහත සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අවශ්‍යය.

| *තනතුරට අදාළ සංකේත අංකය* | *තනතුර* | *02.1.3 අධ්‍යාපන සුදුසුකම්* | | *02.1.4 වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|---|
| | | *අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)* | *අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)* | |
| 1<br><br>2 | කෘෂිකර්ම උපදේශක<br><br>පර්යේෂණ සහකාර | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව, සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ්‍යයන් සහිතව එකවර විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙ.) විභාගය සමත්වීම | කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, යන විෂයයන්ගෙන් විෂයයන් දෙකක් ඇතුළුව විද්‍යා විෂයයන් තුනකින් අ. පො. ස. (උ. පෙ.) විභාගය එකවර සමත්වීම (සාමාන්‍ය ඉංග්‍රීසි හා පොදු පරීක්‍ෂණය හැර), | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක් මගින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව;<br><br>*හෝ*<br><br>රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කිරීම;<br><br>*හෝ*<br><br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත තාක්‍ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබාගැනීමෙන් අනතුරුව/ඉහත සඳහන් තාක්‍ෂණික සුසුදුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම. |

02. 1..5 - *වෙනත් සුදුසුකම්.—*

සියලුම අයැදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති බවට සහතික විය යුතු ය.

* ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
* විශිෂ්ට චරිතයකින් යුක්ත අයෙකු විය යුතු ය.
* යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
* දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට තරම් සුදුසු ශාරීරික හා මානසික සෞඛ්‍යයකින් ද යුක්ත විය යුතු ය.

02.2 - *සීමිත පදනම මත බඳවා ගැනීම.—*

02.2.1

| *තනතුරට අදාළ සංකේත අංකය* | *තනතුර* | *02.2.2 අධ්‍යාපන සුදුසුකම්*<br><br>*අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)* | *02.2.3 වෘත්තීය සුදුසුකම්* | *පළපුරුද්ද* |
|---|---|---|---|---|
| 1<br><br>2 | කෘෂිකර්ම උපදේශක<br><br>පර්යේෂණ සහකාර | භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව යන විෂයයන්ට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06කින් අ. පො. ස. (සා.පෙ.) විභාගය සමත්වීම. | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක් මගින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව;<br><br>*හෝ*<br><br>රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කිරීම;<br><br>*හෝ*<br><br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබාගැනීමෙන් අනතුරුව/ ඉහත සඳහන් තාක්ෂණික සුසුදුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. | අදාළ ක්ෂේත්‍රයේ දෙපාර්තමේන්තු ගත ප්‍රාථමික ශිල්පීය නොවන (PL-01) තනතුරක හෝ ඉන් ඉහළ තනතුරක වෘත්තීය සුදුසුකම් සහිතව වසර 5ක පළපුරුද්දක් ලබා තිබීම. |

**02.2.4 වෙනත් සුදුසුකම් :**

(i) පත්වීම ස්ථිර කර තිබිය යුතු ය.
(ii) නියමිත දිනට පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර නිලධාරියා සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

04. දෙපාර්තමේන්තුවේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් විවෘත ධාරාව මත 70% ක් ද සීමිත ධාරාව මත 30% ක් ද බඳවා ගනු ලැබේ. සීමිත තරග විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළ නොසිටී නම් ඉතිරි ප්‍රමාණය විවෘත තරග විභාගය මගින් ම තෝරාගනු ලබන බාහිර අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ. තවද කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ පිරවීමට හෝ නොපිරවීමට හෝ පත්වීම් බලධාරියාට බලය ඇත.

*වැටුප් හා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ :*

වැටුප් කේත අංකය - MN 03/2006 A
වැටුප් පරිමාණය - රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885

III ශ්‍රේණියට බඳවාගෙන වසර 3ක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද, II ශ්‍රේණියට උසස් වී වසර 3 ක් ඇතුළත දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද සමත්විය යුතු ය. රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරියකු විසින් නියමිත රාජ්‍ය

භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබාගත යුතු ය. පත්වීම් දින සිට වසර 5ක් ඇතුළත තනතුර සඳහා නියම කර ඇති අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය රා. ප. ච. ලේ. 07/2007 හි 1 (ආ) ඡේදයෙහි සඳහන් පරිදි රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් පවත්වන ද්විතීය කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්‍ෂණයෙන් සමත්විය යුතු ය. මෙම රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා නොගැනීම හා කාර්යක්‍ෂමතා කඩඉම් විභාග නියමිත කාලය තුළ සමත් නොවීම ඉදිරි වැටුප් වර්ධක විලම්භනය වීමට හේතු වනු ඇත.

05. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය ;

(ii) නියම කරනු ලබන දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතු අතර, අනුරාධපුර, පොළොන්නරුව, අම්පාර, මහනුවර (හසලක) මොණරාගල, හම්බන්තොට යන දිස්ත්‍රික්කවල හා උතුරු නැගෙනහිර පළාත්වල පිහිටි සේවා ස්ථානවල පුරප්පාඩු පිරවීමට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

(iii) අංක 1426/34 දරන 2006.01.06 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත දැනට බලාත්මක ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවා ව්‍යවස්ථාවේ කොන්දේසි හා ඉදිරියේ දී කරනු ලැබිය හැකි එම සේවා ව්‍යවස්ථාවේ හා බඳවා ගැනීම් පරිපාටිවල සංශෝධනවලට ද ඔබ යටත් විය යුතු ය.

06. *අයදුම් කළ යුතු ක්‍රමය :*

(අ) මෙම විභාගය සඳහා වූ අයදුම්පත් ආකෘතිය මෙම නිවේදනයේ අවසානයේ පළ කර ඇත. ඒ අනුව අයදුම්පත A4 (21cm x 29cm) පරිමාණයේ කඩදාසියක පමණක් දෙපැත්තේම පිළියෙල කළ යුතු වේ. ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 04 තෙක් පළමුවන පිටුවට ද, 05 සිට 07 තෙක් දෙවන පිටුවට ද, ඉතිරිය 03 වන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු ය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය *ගැසට් නිවේදනයේ* සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ආ) විවෘත/සීමිත තරග විභාග දෙකම එකම විභාගයක් ලෙස පවත්වනු ලබන හෙයින් එක් අයදුම්කරුවකු සඳහා සීමිත හා විවෘත යන කාණ්ඩ දෙක සඳහාම අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට නොහැක. ඒ අනුව එක් අයදුම්කරුවකුට අයදුම් කළ හැක්කේ සීමිත හා විවෘත යන කාණ්ඩ දෙකෙන් එක් කාණ්ඩයක් සඳහා පමණි.

(ඇ) මෙහි සඳහන් තනතුරු 02 සඳහාම යම් ඉල්ලුම්කරුවකු විසින් ඉල්ලුම් කරනු ලබන්නේ නම් එක් ඉල්ලුම්පත්‍රයක් පමණක් භාවිතා කළ යුතු ය.

(ඈ) විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතු වේ.

(ඉ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2015 නොවැම්බර් මස 20 වැනි දින හෝ ඊට ප්‍රථම "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

(ඊ) අයැදුම්පත් බහාලන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ "කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාගය - 2015" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(උ) අපේක්‍ෂකයකුට තනතුරු එකකට හෝ සියල්ලටම ඉල්ලුම් කළ හැකි අතර විභාග ගාස්තුව රු. 750 කි. එම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ 2003-02-13 ආදායම් ශීර්ෂය යටතේ දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට ගෙවා ඒ සඳහා නිකුත් කරනු ලබන ලදුපත් (මුල් පිටපත) අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතු ය. එම ලදුපතේ ඡායා පිටපතක් ළග තබා ගැනීම මතුවට ප්‍රයෝජනවත් වනු ඇත. කිසිම හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

(ඌ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර තැපෑලේ දී සිදුවන නැතිවීම් හා ප්‍රමාදවීම් ගැන කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(එ) අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද,

එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

(ඒ) දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් තම ආයතන ප්‍රධානියා මගින් මෙම අයදුම්පත ඉදිරිපත් කළ යුතු ය.

07. *විභාග පරිපාටිය* :

(අ) *ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස්* සීමාව තුළ වන අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය, නගරය හා ඉල්ලුම් කරන තනතුරු ද, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීමද, අදළ නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්‍ෂකයකු තමාට නියමිත මධ්‍යස්ථානයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්‍ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(ආ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපත ද, විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපත ද, ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව, ඉල්ලුම් කරන ලද විභාගයේ නම, ඔබගේ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කොට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම්, ඉහත විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින් ම විමසා සිටීම ද වඩාත් ඵලදායී වනු ඇත.

(ඇ) මෙම විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්‍ෂක/අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(ඈ) *අනන්‍යතාව.*—තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්‍ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කළ යුතු ය. මේ සඳහා –

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම්පත; හෝ

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගැනේ.

(ඉ) *විෂය නිර්දේශය* :

1. බුද්ධි පරීක්‍ෂණය (කාලය පැය 1යි, මුළු ලකුණු 100යි)
අපේක්‍ෂකයාගේ සිතීමේ තර්කානුකූලත්වය, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයන්, තීරණය කිරීමේ ශක්තිය විනිශ්චය කිරීම සඳහා වූ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

2. විෂයානුබද්ධ දැනුම (කාලය පැය 2යි, මුළු ලකුණු 100යි)
අපේක්ෂකයාගේ විෂයානුබද්ධ දැනුම පිළිබඳ ව්‍යුහගත ප්‍රශ්නවලින් යුක්ත ප්‍රශ්න පත්‍රයකි.

| | *තනතුර* | *විෂයානුබද්ධ දැනුම ප්‍රශ්න පත්‍රයේ විෂය නිර්දේශය* |
|---|---|---|
| 1.<br>2. | කෘෂිකර්ම උපදේශක<br>පර්යේෂණ සහකාර | ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මයේ දායකත්වය/ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම /පස හා ශාක පෝෂණය/වී නිෂ්පාදනය/වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය/එළවළු නිෂ්පාදනය, පළතුරු නිෂ්පාදනය/බෝග ආරක්‍ෂණය/පාංශු සංරක්‍ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්‍ෂණ ක්‍රම/වාරිමාර්ග හා ජල කළමණාකරණය/ගොවිපල යාන්ත්‍රීකරණය/මී මැසි පාලනය/මල් වගාව හා භූමි අලංකරණය/ආරක්‍ෂිත බෝග වගාව/සත්ත්ව පාලනය/කෘෂි කාර්මික ව්‍යාපෘතිය/පටක රෝපණය/ පැළෑටි නිරෝධායනය/ශාක සංරක්‍ෂණය හා එහි වැදගත්කම/ජෛව තාක්‍ෂණය/බීජ නිෂ්පාදනය/කෘෂිකර්ම සංවර්ධනය |

(ඊ) *මාධ්‍යය :*

විභාගය පැවැත්වෙන්නේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යවලිනි. අපේක්ෂකයින් විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම මාධ්‍යයකින් පෙනී සිටිය යුතු ය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(උ) *ගැසට් නිවේදනයේ* සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. ඉහත (ඉ) හි සඳහන් තනතුරු 02ටම ඉල්ලුම් කරන්නේ නම් ඒ සියල්ලම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරමින් එක් ඉල්ලුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ යුතු ය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

(ඌ) *විභාගය පවත්වන ස්ථානය හා දිනය.*—මෙම විභාගය 2016 ජනවාරි මාසයේ දී කොළඹ දී හා මහනුවර දී විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ. යම් හෙයකින් ප්‍රමාණවත් අපේක්ෂක සංඛ්‍යාවක් ඉදිරිපත් නොවුවහොත් කොළඹ දී පමණක් විභාගය පැවැත්වීමට කටයුතු කරනු ඇත. (ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

| *විභාග මධ්‍යස්ථානය* | *සංකේත අංකය* |
|---|---|
| කොළඹ | 1 |
| මහනුවර | 2 |

08. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) ඉහත විභාගයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලැබූ අයදුම්කරුවන්ගේ මුළු ලකුණු එකතුව අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනය මත බඳවා ගැනීම් සඳහා සලකා බලනු ලැබේ.

(ii) කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මෙම විභාගයේ ලකුණු කුසලතාව පදනම් කරගෙන අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් සපුරා ඇති අය පමණක් පුරප්පාඩු සඳහා තෝරා ගනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු පිරිනමනු නොලැබේ.)

(iii) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සංඛ්‍යාව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

(iv) තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව සම්මුඛ පරීක්ෂණයේ දී අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(v) *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම්, ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට සම්පූර්ණ කර නොමැතිව තිබිය දී විභාගයට ඉදිරිපත්ව විභාගය සමත්වුව ද සම්මුඛ පරීක්ෂණය සඳහා සලකා නොබලන අතර කිසිදු දැනුම් දීමකින් තොරව ඔහුගේ/ඇයගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vi) ව්‍යාජ තොරතුරු හා කූට ලේඛන ඉදිරිපත් කර යම් අයකු පත්වීමක් ලබාගත්තේ වුවද ඒ බව අනාවරණය වූ වහාම ඔහුගේ/ඇයගේ පත්වීම අවලංගු කිරීමට හා ඔහුට/ඇයට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

(vii) *ප්‍රතිඵල නිකුත් කිරීම.*—එක් එක් විෂයයට ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබා සමත් අපේක්ෂකයින්ගේ ලේඛනයක් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ දැනුම්දීම අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා ලබාදෙනු ඇත.

09. මෙම නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

10. මෙම විභාග නිවේදනයේ භාෂාත්‍රයෙන් වූ දැන්වීම් අතර කිසියම් අනනුකූලතාවක් වේ නම්, එවැනි විටක දී සිංහල නිවේදනය බලපැවැත්වේ.

ආචාර්ය ආර්. ආර්. ඒ. විජේකෝන්,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2015 ඔක්තෝබර් මස 07 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත්‍රය**

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015**

**Application for Open Competitive Examination for Recruitment to Vacancies in the Grade III of the Sri Lanka Technological Service in the Department of Agriculture - 2015**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 02
දෙමළ - 03
ඉංග්‍රීසි - 04 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

විභාගයට පෙනී සිටින විභාග මධ්‍යස්ථානය : කොළඹ - 1
මහනුවර - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ඉල්ලුම් කරන තනතුර/තනතුරු (ප්‍රමුඛතාව අනුව ඉල්ලුම් කරන තනතුරු අනු පිළිවෙලින් ලියන්න)

කෘෂිකර්ම උපදේශක - 01
පර්යේෂණ සහකාර - 02

| ඉල්ලුම් කරන තනතුරු | තනතුරු අංකය |
|---|---|
| | |
| | |

01. නම :
1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
*උදා.* : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොද නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උදා.* : GUNAWARDHANA H. M. S. K.)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

1.5 දුරකථන අංකය :————.

02. ස්ථිර ලිපිනය :
2.1 ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.

2.2 සිංහලෙන්/දෙමළෙන් :————.

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

2.4 පදිංචි දිස්ත්‍රික්කය :————.

2.5 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

03. ස්ත්‍රී /පුරුෂ භාවය :
ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04. 4.1 උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

4.2 ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :

වර්ෂ | | | | | මාස | | | දින | | |

4.3 විවාහක/අවිවාහක බව :
අවිවාහක - 1
විවාහක - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. අධ්‍යාපන සුදුසුකම් : (භාෂා මාධ්‍යය සමග) :

(අ) අ. පො. ස. (සා. පෙළ.) විභාගය

(i) වර්ෂය හා මාසය :—————.
(ii) විභාග අංකය :—————.
(iii) භාෂා මාධ්‍යය :—————.
(iv) ප්‍රතිඵල :

| | විෂයයන් | සාමාර්ථය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |
| 9 | | |
| 10 | | |

(ආ) අ. පො. ස. (උසස් පෙළ) විභාගය :
(i) වර්ෂය හා මාසය :—————.
(ii) විභාග අංකය :——————.
(iii) භාෂා මාධ්‍යය :——————.
(iv) විභාගයේ ප්‍රතිඵල :

| විෂයයන් | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

06. වෘත්තීය සුදුසුකම් :

| ඩිප්ලෝමාව | ඩිප්ලෝමාව නිකුත් කළ ආයතනයේ නම | සමත් වූ වර්ෂය | මාධ්‍යය | විභාග අංකය | ඩිප්ලෝමාව වලංගු දිනය |
|---|---|---|---|---|---|
| | | | | | |

07. විභාග ගාස්තු ගෙවන ලද තැපැල්/උපතැපැල් කාර්යාලය -
7.1 ගාස්තු ගෙවන ලද දිනය :——————.
7.2 ලදුපත් අංකය :——————.
7.3 මුදල :——————.

| විභාග ගාස්තු ගෙවන ලද ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න.) |
|---|

08. මෙම විභාගයේ කොන්දේසි සියල්ල පිළිපැදීමට මම එකඟ වෙමි.

09. *අයදුම්කරුගේ සහතිකය :*

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත් ඒවා බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත්, මා නුසුදුස්සකු වීමට යටත්වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දැන සිටිමි. තව ද විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි. එසේම මා විසින් ඉල්ලුම් කරන තනතුරු සඳහා එක් ඉල්ලුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කරන බවට ද සහතික වෙමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

10. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................ යන අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ............ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

——————,
අත්සන සහතික කරන ලද
නිලධාරියාගේ අත්සන.

දිනය :——————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :——————.
තනතුර :——————.
ලිපිනය :——————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

10.1 දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්තවූවන් සඳහා (අනවශ්‍ය වචන කපා හරින්න).

ඉහත විස්තර දැක්වෙන අයදුම්කරුට/අයදුම්කාරියට මෙම විභාගය සඳහා පෙනී සිටීමට ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති/නැති බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය මෙම දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරෙන් මුදා හැරීමට හැකි/නොහැකි බවත් සහතික කරමි.

——————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා පදවි නාමය
(නිල මුද්‍රාව).

දිනය :——————.

10-958

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.